**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2012**

**1. මතය**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිවිසුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගණුම්කරණ මූලධර්මවලට ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ ඩොලර් ගිණුමෙන් ආරම්භක තැන්පතුව, ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන් අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ව ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.171,498,584 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.177,530,885 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| පරිගණක දෘඩාංග හා උපාංග | 8,180,788 | 679,000 | 8,859,788 |
| කාර්යාල උපකරණ | 351,976 | 700,120 | 1,052,096 |
| ලී බඩු හා උපකරණ | 932,656 | 559,442 | 1,492,098 |
| මෝටර් වාහන | 16,504,000 | - | 16,504,000 |
| සංවර්ධන වියදම් | 145,529,164 | 4,093,739 | 149,622,903 |
| **එකතුව** | **171,498,584** | **6,032,301** | **177,530,885** |

ව්‍යාපෘතියේ කාර්යන් 2012 ජූලි 10 දින ආරම්භ කර තිබුණි. එසේ වුවද 2011 ජූලි 15 දින සිට 2012 ජූලි 09 දින දක්වා කාලයට අදාල මූලික වියදම් හා පොදුකාර්ය වියදම් වශයෙන් රු.30,086,789 ක්වූ මුදලක් ඒකාබද්ධ අරමුදලෙන් වැය කර තිබුණි. විස්තර පහත දැක්වෙන පරිදිය.

| අයිතමය | 2011 ජූලි 15 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා වියදම | 2012 ජනවාරි 01 දින සිට 2012 ජූලි 09 දින දක්වා වියදම | 2012 ජූලි 09 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පරිගණක දෘඩාංග හා උපාංග | 679,000 | 2,454,720 | 3,133,720 |
| කාර්යාල උපකරණ | 700,120 | 133,388 | 833,508 |
| ලී බඩු හා සවිකිරීම් | 559,442 | 718,861 | 1,278,303 |
| මෝටර් වාහන | - | 12,276,000 | 12,276,000 |
| සංවර්ධන වියදම් | 4,093,739 | 8,471,519 | 12,565,258 |
| **එකතුව** | **6,032,301** | **24,054,488** | **30,086,789** |

## 2.2 විශේෂ ඩොලර් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී විශේෂ ඩොලර් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | 2012 | |
|---|---|---|
| | එ.ජ.ඩො | රු. |
| ආරම්භක තැන්පතුව | 2,000,000 | 263,884,800 |
| | 2,000,000 | 263,884,800 |
| අඩු කළා - ආපසු ගැනීම් | (1,996,961) | (257,491,816) |
| විදේශ විනිමය අවාසිය | - | (6,006,577) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,039** | **386,407** |

## 3. නිරීක්ෂණ

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.9,743,924 ක් වූ වේතන සහ පොදු කාර්ය වියදම් උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර නොතිබුණි.

(ආ) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සමඟ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු රු.14,673,676 ක් වූ එකතු කළ අගය මත බදු (එඅබ) 2012 වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ වොක්ෂෝල් වීදියේ ප්‍රමාණය කි.මී.2.605 ක් වූ පදිකයන් සඳහා ඇවිදින මන්තීරු ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.239,268,702 ක් වූ මුදලකට 2012 සැප්තැම්බර් 27 දින කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නිශ්චිතව හඳුනාගත් ස්ථාන වල බාධාකාර් ලෙස මෝටර් රථ හා මෝටර් බයිසිකල් ගාල් කර තිබුණි.

(ii) වාහන ධාවනය කිරීම හා ගාල් කිරීම හේතු කොට ගෙන නිශ්චිත ස්ථාන වල සවි කර තිබුණු කොන්ක්‍රීට් කැබලි පුපුරා පොලව යටට ගිලා බැස තිබුණි.

(iii) වැහි වතුර බැස යාමට සවිකර තිබුණු ගලි කටවල් විධිමත්ව සවි නොකිරීම හේතු කොට ගෙන නිසියාකාරව ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) කොළඹ නගර සීමාව තුල මිනිස්සුන්, ගැහැණුන් සහ ආබාධිතයින් සඳහා වැසිකිළි සංකීර්ණ 7 ක් ඉදිකිරීමට රු.50,453,800 ක කොන්ත්‍රාත් මුදලකට 2012 අගෝස්තු 23 දින කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණි. එම වැසිකිළි සංකීර්ණ පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

<u>වොක්ෂෝල් වීදිය</u>

(i) පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා උපකරණ සඳහා ගබඩා පහසුකම් නොතිබුණි. කෙසේ වුවත් සියළුම ද්‍රව්‍ය හා උපකරණ එක් වැසිකිළියක තබා තිබුණි.

(ii) පිරිමි වැසිකිළි වලට සවිකර තිබුණු උත්තේජක ඒකක අක්‍රීයව තිබුණි.

<u>වැල්ලවත්ත</u>

(i) වැසිකිළියේ පිටත සවිකර තිබුණු විදුලි ලාම්පු අක්‍රීයව තිබුණි.

(ii) මූණ සෝදන බේසම් වලින් පිටතට ගලා යායුතු ජලය වැයිකිළියේ පොලව මතුපිටට ගලමින් තිබුණි.

<u>බම්බලපිටිය</u>

සවිකර තිබුණු බිත්ති ලාම්පු මලකඩ කා තිබුණි.

## 4. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 4.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

2012 දෙසැම්බර් 31 දින වන විට අරමුදල් මූල්‍යකරණයට අදාල වැදගත් නිශචිත සංඛ්‍යා, සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ප්‍රතිපාදනය හා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| විස්තරය | ණය ගිවිසුමට අනුව එකඟ වූ මූල්‍යකරණ වටිනාකම | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2012 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දින වන විට අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ප්‍ර.ස.ජා.බැ | 213 | 27,890.22 | 130.94 | 327.06 | 327.06 |
| ඒ.අ | 108 | 14,141.52 | 100.00 | 58.88 | 64.91 |
| **එකතුව** | **321** | **42,031.74** | **230.94** | **385.94** | **391.97** |

## 4.2 භෞතික කාර්යය සාධනය

2012 ජුලි 10 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුල කොන්ත්‍රාත් 7 ක් ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර ඒවායේ කාර්යසාධනය පහත දැක්වේ.

| උප සංරචකය | පැකේජ අංකය | කොන්ත්‍රාත්තුවේ නම | එකතු කළ අගය මත බදු හැර කොන්ත්‍රාත් අගය | කොන්ත්‍රාත් කාලය | ආරම්භ කළ දිනය | වැඩ සම්පූර්ණ කළ වටිනාකම | 2012 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය - සැලසුම් කළ ප්‍රගතිය | 2012 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය - තත්‍ය ප්‍රගතිය | විචලතාවය හිතකර / (අහිතකර) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. මිලියන | මාස | | රු. මිලියන | (%) | (%) | (%) |
| 1.1 | එස්එල්එල් ආර්ඩීසී/ඩබ්/02 | අළුත් මාවත බෝක්කුව, මුතුවැල්ල පෙට්ටි ඇල, මෝදර උමගේ මනු බිල, මෝදර මෝය කටේ ඇල ඉවුර වැඩිදියුණු කිරීම සහ ප්‍රධාන අපවහන ඇල ඉවුර සංරක්ෂණය කිරීම. | 409.97 | 18 | 2012 /11/ 12 | - | 7 | 5 | (2) |
| 2.1 | සීඑච්සී/ඩබ්/01 | මහජන පොදු පහසුකම් වැඩිදියුණු කිරීම - පැකේජ 01 | 50.95 | 06 | 2012 /09/12 | 4.0 | 61 | 24 | (37) |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.1 | සීඑච්සී/ඩබ්/02 | ඇවිදින මංතීරු වැඩි දියුණු කිරීම හා ගල් තාර දමා වැසීම - පැකේජ 01 | 239.26 | 07 | 2012 /09/ 25 | 5.69 | 20.2 | 15.8 | (4.4) |
| 2.1 | සීඑච්සී/ඩබ්/04 | ඇවිදින මංතීරු වැඩි දියුණු කිරීම හා ගල් තාර දමා වැසීම - පැකේජ 02 | 260.49 | 09 | 2012 /09/ 27 | 24.85 | 10 | 11 | 1 |
| 2.1 | සීඑච්සී/ඩබ්/06 | නගර සභා චතුරස්‍රය ආකෘතිමය කලාපයක් ලෙස දියුණු කිරීම - පැකේජ 02 | 308.88 | 11 | 2012 /10/01 | 12 | 18 | 7 | (11) |
| 2.1 | සීඑච්සී/ඩබ්/08 | ඇවිදින මංතීරු වැඩි දියුණු කිරීම හා ගල් තාර දමා වැසීම - පැකේජ 02 | 283.51 | 09 | 2012 /09/29 | 15.4 | 24.5 | 19 | (5.5) |
| 2.1 | සීඑච්සී/ඩබ්/09 | නගර සභා චතුරස්‍රය ආකෘතිමය කලාපයක් ලෙස දියුණු කිරීම - පැකේජ 01 | 77.24 | 11 | 2012 /09/14 | 7.677 | 38 | 21 | (17) |